**ශීර්ෂය 299 - ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය නොකල මතය

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජූලි 02 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 20 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්වාගණනය නොකල මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණු බැවින්, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැක. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ද මෙම වාර්තාවෙන් ඉදිරිපත් නොකෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 දේපල පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රේඛීය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත මිලදී ගත් රු.3,861,267 ක් වූ වත්කම් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ වෙනත් යන්ත්‍ර හා උපකරණ යටතේ දක්වා තිබුණි. | රේඛීය අමාත්‍යාංශයෙන් මිලදී ගත් වත්කම් පවරා ගැනීමක් සිදු කිරීමෙන් පසුව ආයතනයේ වත්කම් ලෙස ගිණුම් ගත කළ යුතුවීම. | වත්කම් මිලදී ගැනීමේ පිරිවැය වාර්තාගතකර ඇතත් ලිඛිතව අමාත්‍යාංශය වෙත දැනුම්දීමට අපොහොසත් වී ඇති බවත්, කර්මාන්ත අමාත්‍යාංශය දැනුවත් කර මෙම වත්කම් පවරා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |

### 1.6.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කාර්යාලය මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ (ඇ) හි සඳහන් විධිවිධාන පරිදි කාර්යාලීය මූල්‍ය පාලනය හා එහි සඵලදායී බව පිළිබඳ වන සමාලෝචන වාර්තාව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් ඉදිරිපත් කළ යුතු වන අතර 2018 වර්ෂයේදී එම කාර්ය අතපසුවී ඇත. මේ පිළිබඳ අමාත්‍යාංශය දැනුවත් කර විගණන පනතේ විධිවිධාන පරිදි සහතික කිරීම විගණකාධිපති වෙත ලිඛිතව දැනුම්දීමට ඉදිරියේදී කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |
| (ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති | - එම - | අභ්‍යන්තර විගණක තනතුරක් ඇතිකර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන |

| | | |
|---|---|---|
| බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | | ඇත. 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අනුමැතිය ලබාදී ඇත්තේ 2020 වර්ෂයේ සිට වන බැවින් එම වර්ෂයේදී පුරප්පාඩුව පිරවීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් ද කර ඇත. |

### 1.6.3 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **නීතිරීති හා රෙගුලාසි වලට යොමුව**<br>2006 අංක 01 දරන බුද්ධිමය නියෝග 58(2) වගන්තිය මගින් සංශෝධිත 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 175 වන වගන්තිය | | |
| අනුයෝජිතයින් බඳවා ගැනීම හා ලියාපදිංචි කිරීම සඳහා වූ විභාගය පනතේ සඳහන් විධිවිධානවලට අනුකූලව පවත්වා අනුයෝජිතයින් පත්කර ගැනීමට කටයුතු කළ යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. | පනතේ වගන්තියට අනුකූලව කටයුතු කළ යුතු වීම. | අනුනියෝජිතයන් බඳවා ගැනීමේ අවශ්‍යතාවය සලකා බලා බුද්ධිමය දේපල කොමිෂන් සභාව සමඟ සාකච්ඡාකර සංශෝධන කරන බවට දන්වා ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වෙනත් අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

රේඛීය අමාත්‍යාංශය විසින් ජාත්‍යන්තරව වෙළඳ ලකුණු ලියාපදිංචිය සඳහා වූ මැඩ්රිඩ් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2018 වර්ෂයට අදාළව රු.29,000,000 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. එයින් රු.17,176,802 ක් පමණක් උපයෝජනය කිරීම හේතුවෙන් ඉතිරිය රු.11,823,198 ක් වූ අතර එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 40 ක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වෙළඳ ලකුණු අයදුම්පත්‍රයක් පිළිගත් පසු ලියාපදිංචි කිරීමේ අවස්ථාවට පෙර ගැසට් පත්‍රයේ | ගාස්තු අයකිරීමක් සිදුකර ඇති විට ව්‍යාපෘතියෙන් ද මුදල් | වෙළඳ ලකුණු අයදුම්පත්‍රයක් පිළිගත් පසු ලියාපදිංචි කිරීමේ අවස්ථාවට පෙර ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා අයදුම්කරුවන් |

| | | | |
|---|---|---|---|
| | ප්‍රසිද්ධ කිරීම සඳහා රු.14,107,927 ක් හා භාෂා පරිවර්තන ගාස්තු වශයෙන් රු.444,200 ක් වශයෙන් මුළු වටිනාකම රු.14,552,127 ක් සමාලෝචිත වර්ෂය සඳහා වැය කර තිබුණි. එසේ වුවද ප්‍රසිද්ධ කිරීමේ ගාස්තු වශයෙන් සේවාදායකයින්ගෙන් ද ගාස්තු අයකර ගනු ලබන අතර එම ගාස්තු වැය කිරීමක් සිදු නොකර ව්‍යාපෘතියේ මුදල් වැයකර තිබුණි. 2017 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය සඳහා ලබාදුන් රු.26,000,000 ක් වූ ප්‍රතිපාදනයෙන් රු.14,635,318 ක් ද මෙම කාර්යය සඳහාම වැය කර තිබුණි. | වැය කිරීම නොකළ යුතු වීම. | අනිවාර්යයෙන් ගාස්තුවක් රජයේ මුද්‍රණාලය වෙනුවෙන් ගෙවිය යුතු වේ. එසේ ගෙවූ පසු ගැසට් ප්‍රකාශ අංශය මඟින් භාෂා තුනකින් යුක්තව පරිවර්තනය කර රජයේ ගැසට් පත්‍රයට යවනු ලැබේ. අප විසින් ගැසට් පත්‍රයේ පළ කිරීමට අයකරන එම මුදල රජයට වෙනත් මාර්ගයකින් ලැබෙන ගාස්තුවක් වන අතර පෞද්ගලික අංශයට කළ ගෙවීමක් නොවේ. |
| **(ආ)** | වෙළඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීම පිළිබඳ පටිපාටියට අදාළ නීතිමය අවශ්‍යතා සම්පූර්ණ වන පරිදි බුද්ධිමය දේපළ පනතට අවශ්‍ය සංශෝධන හා රෙගුලාසි සැකසීමේ ප්‍රධාන අරමුණ වශයෙන් හා ඊට අමතරව වෙළඳ ලකුණු ලියාපදිංචිය යාවත්කාලීන කිරීම සඳහා උපදේශක සමාගමක සේවය ලබා ගෙන තිබුණි. මේ සඳහා 2017 වර්ෂයේදී හා 2018 වර්ෂයේ පිළිවෙලින් රු.4,504,877 ක් හා රු.1,995,123 ක් වශයෙන් එකතුව රු.6,500,000 ක් ගෙවා තිබුණි. සමාගම විසින් සකස් කර තිබූ පනත් කෙටුම්පත 2017 ඔක්තෝබර් මාසය අවසන් වන විට කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු බවට ගිවිසුම් ගත වී තිබුණද, එම කාර්යය ඉටු වී නොතිබූ අතර ගිවිසුම් ගත එකඟතාවයද 2018 අප්‍රේල් මාසයේදී අවසන් වී තිබුණි. | සැලසුම් කරන ලද කාර්යයන් නියමිත කාලයේදී ප්‍රමාදයකින් තොරව ඉටුකිරීමට කටයුතු කල යුතු අතර වැය කරනු ලබන මුදල් වලට ප්‍රමාණවත් කාර්යයක් ඉටු කළ යුතු වීම. | අගෝස්තු 02 දිනැති කැබිනට් පත්‍රිකාව මඟින් ලබාදුන් අනුමැතිය පරිදි බාහිර සේවා සපයන ආයතනයක සේවය ලබා ගැනීමට සිදු විය.<br>2018 වසරේ මුල් භාගයේදී බුද්ධිමය දේපළ උපදේශන කොමිෂන් සභාව විසින් ප්‍රකාශන හිමිකම් පිළිබඳ රෙගුලාසි හා භූගෝලීය දර්ශක සම්බන්ධ නීති කෙටුම්පත් පිළිබඳ 2017 වසර තුළ නිමකල යුතුව තිබූ ඉතා හදිසි වූ සංශෝධනයන් පිළිබඳ අධ්‍යනය කරමින් සිටීම හේතුවෙන් මැඩ්රිඩ් ගිවිසුමට අනුව සැකසූ නීති සංශෝධන සාකච්ඡාවට ගැනීමට කල්ගත විය. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

-----------------------------------------------------------------------

දැනට ක්‍රියාත්මක මැඩ්රිඩ් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් 2016 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දක්වා රු.64,000,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණ අතර රු.62,257,628 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>--------------------- | නිර්දේශය<br>---------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>--------------------------------------- |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සර්වර් යන්ත්‍රය මිලදී ගැනීමට, පද්ධතිය ස්ථාපිත කිරීම හා පළමුවන, දෙවන, තෙවන වර්ෂවල නඩත්තු කටයුතු සඳහා ගෙවිය යුතු රු.මිලියන 7.5 ක් ද ඇතුළත්ව රු.මිලියන 32.5 ක් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනයට 2016 දෙසැම්බර් මාසයේ ගෙවා තිබුණි. දෙපාර්ශවය අතර මෙම කාර්යය සඳහා අත්සන් කර තිබූ අවබෝධතා ගිවිසුමෙන් ගෙවීම් කළ යුතු ආකාරය පිළිබඳ කිසිදු සටහනක් ඇතුළත් කර නොතිබුණු අතර සම්පූර්ණ පිරිවැය ඇස්තමේන්තුවක් පමණක් ඇතුළත් කර තිබුණි. ගිවිසුමේ 4.3 වගන්තියට අනුව ආයතනය සම්පූර්ණ මිලදී ගැනීමේ ක්‍රියාවලිය සඳහා වගකිව යුතු බවත්, ගිවිසුම් ගත දින සිට මාස 06 ක් ඇතුළත එම කාර්යය සිදු කළ යුතු බවත් දක්වා තිබුණි. එසේ වුවද 2019 මැයි මාසය අවසාන වන විටත් සර්වර් යන්ත්‍රය මිලට ගැනීම් කටයුතු සිදුකර නොතිබුණි. | වැය කරනු ලබන මුදල් වලට උපරිම ප්‍රතිලාභ ලබා ගත යුතු වීම. | සර්වර් යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන නියෝජිතායතනය (ICTA) විසින් නියමිත ප්‍රසම්පාදන කාර්යය 2017 වසරේ ආරම්භ කර තිබූ අතර 2019 පෙබරවාරි 12 වන විටත් අදාළ කටයුතු ඉටු කිරීමට එම ආයතනය අපොහොසත් වී ඇති බැවින 2019 පෙබරවාරි 12 වන දිනැති ලිපිය මඟින් මේ සඳහා ගතහැකි නීතිමය පියවර පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවෙන විමසීමක් සිදු කර ඇත. මේ පිළිබඳව 2019 පාර්ලිමේන්තු අයවැය විවාදයේදී ඇති වූ ප්‍රශ්න කිරීම අනුව ICTA ආයතනයෙ නිලධරයන් සමඟ 2019 මාර්තු 23 වන දින සාකච්ඡාවක් පැවැත් වූ අතර මෙතෙක ඒ පිළිබඳ ICTA ආයතනය කිසිදු තීරණයකට එළඹී නොමැත. ICTA ආයතනය මෙම ප්‍රසම්පාදනය ඉටුකර දීමට මෙතෙක් නිසි පියවර නොගැනීම හේතුවෙන් මීළඟ පියවර ලෙස අදාළ චක්‍රලේඛ පරිදි කැබිනට් මණ්ඩලය වෙත ලිඛිත දැනුම් දීමක් මඟින් යොමු කළ යුතු බවට අමාත්‍යාංශ ලේකම්තුමා තීරණය කරන ලදී. ඒ අනුව මේ වන විට එම ලේඛනය සකසමින් පවති. |
| (ආ) | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය භෞතික පහසුකම් ගොඩනැංවීමේ අරමුණින් වාණිජ මණ්ඩල ගොඩනැගිල්ලේ බිම් මහල කුලී පදනම මත ලබා ගෙන තිබුණි. 2016 මැයි මාසයේ සිට 2018 මැයි මාසය දක්වා වූ වර්ෂ දෙකක කාලපරිච්ඡේදයක් සඳහා කුලී වශයෙන් රු.4,672,500 ක් ගෙවා තිබුණද අදාළ කාර්යය සඳහා ප්‍රයෝජනයට නොගෙන ඉවත් කරනු ලබන ද්‍රව්‍ය ගබඩාවක් ලෙස භාවිත කර | මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනයෙන් උපරිම ප්‍රතිඵල ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | මැඩ්රිඩ් ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් කාර්යාල පරිශ්‍රය තුළ ඉඩකඩ වෙන් කිරීමට සිදුවූ අතර ඒ හේතුවෙන වාණිජ මණ්ඩලයට අයත් ගොඩනැගිල්ලෙ බිම් මහල වෙත ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ හා ලිපිගොනු මාරුකරන ලදී. මැඩ්‍රිඩ් ව්‍යාපෘතිය යටතේ රාජකාරි කටයුතු කරගෙන යෑම සඳහා IPAS වැඩසටහන අවශ්‍යවන අතර එම අංශය එහි ස්ථාපනය කරන ලද්දේ නම් ඒ සඳහා අධික පිරිවැයක් දරා එනම් රු.මිලියන 02කට අධික මුදලක් වැය කර IPAS පද්ධතිය |

| | |
|---|---|
| තිබුණි. | ක්‍රියාත්මක කිරීම සඳහා ජාල ගත කිරීම (Networking) කළ යුතුව තිබුණි. මැඩිරිඩ් ව්‍යාපෘතිය යටතේම ඉටුකෙරෙන රාජකාරි වන, ඉවත්කල යුතු ගොනු තැන්පත් කිරීම සඳහා මෙම ඉඩ පහසුකම ලබා ගන්නා ලදි. |

## 3.2 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කාර්යාලය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් කාර්යාලයේ 2015,2016 හා 2017 වර්ෂවල කාර්යසාධන වාර්තා 2019 මැයි අවසාන වන විටත් සභාගත කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | 2015 හා 2016 වර්ෂ සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත කාර්ය සාධන වාර්තා අනුමැතිය සඳහා ජනාධිපති කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. 2017 කාර්ය සාධන වාර්තාව අනුමැතිය සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 133 සහ 2018 අංක 19 දරන විගණන පනතේ 40(1) උප වගන්තිය අනුව අභ්‍යන්තර විගණනකවරයකු පත්කර නොතිබූ අතර, අමාත්‍යාංශයේ විගණන අංශය මගින් හෝ අභ්‍යන්තර විගණනයක් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා පනතේ විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ කටයුතු පිළිබඳව අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතු වීම. | දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණක තනතුරක් 2019.04.06 දිනැති ලිපිය මගින් අනුමත කර ඇති අතර 2019 වර්ෂයේ ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් එම තනතුර සඳහා නිලධාරියෙක් අනුයුක්ත කර ගැනීම ගැටළු සහගත වී ඇත. කෙසේ වෙතත් මෙම පුරප්පාඩුව පුරවන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ඉල්ලීම් කර ඇත. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 නොවැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 98 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 81 ක් වූයෙන් පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 17 ක් විය. | අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කල යුතුවීම. | පුරප්පාඩු තනතුරු බඳවා ගැනීමට දැනටමත් කටයුතු කරමින් යන බව දක්වා ඇත. |
| (ආ) | තෘතීයික මට්ටමේ පේටන්ට් පරීක්ෂක තනතුරු 10 න් 09 ක්ම පුරප්පාඩුව පවතින අතර පේටන්ට් බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු ප්‍රමාදවීමට මෙය ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. | -එම- | -එම- |